# අධිරාජ්‍යාට ඇඳුම් නොමැත

# වසංගත සමයේදී ඇඟළුම් සැපයුම් දාමය - දෙවන නිකුතුව

## හැඳින්වීම

ආසියානු බිම් වැටුප් සන්ධානය (AFWA) යනු ආසියානු කම්කරු නායකත්වය යටතේ ගෝලීය කම්කරු සහ සාමාජීය සංධානයකි. මෙය කොවිඩ් - 19 වසංගතය නිසා වූ ඇඟළුම් නිෂ්පාදනය කරන රටවල සේවකයින් මත වන බලපෑම AFWA හවුල්කාර පාර්ෂව සහ මිත්‍ර පාර්ශව මඟින් කාම්බෝජය, ඉන්දියාව, මියන්මාරය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව ආදී රටවලින් ලැබෙන වාර්තා සහ දේශීය සහ ජාතික සන්නිවේදන තොරතුරු මත පදනම්වී නිරීක්ෂණය කරමින් සිටී. අධිරාජ්‍යාට ඇඳුම් නොමැත යන වාර්තාමාලාව මඟින් ගෝලීය දක්ෂිණ ශ්‍රමිකයන්ගේ සහ කම්කරු සංගම්වල දෘෂ්ටිකෝණයට අනුව ප්‍රකාශයට පත්කර ඇත.

පළමු නිකුතුව "අධිරාජ්‍යාට ඇඳුම් නැත" මඟින් වසංගතය නිසා ගෝලීය සැපයුම් දාමයේ වූ මූලික බලපෑම් නිරීක්ෂණය විය.[1] එහි වාර්තාව මඟින් විවිධ රජයන් මඟින් දැක්වූ ප්‍රතිචාර (ආසියානු ප්‍රමුඛපෙලේ ඇඟළුම් නිෂ්පාදනය කරන රටවල) හුවාදැක්වූ අතර වැටුප් ගෙවීම් සම්බන්ධ ගැටළුකාරී තත්වයන්, සාමාජීය ආරක්ෂණයේ අවම බව සහ සෞඛ්‍ය සේවා සඳහා ඇතුල්වීමට ඇති බාධක සහ සංක්‍රමණික සේවකයින්ට බලපාන සුවිශේෂී තත්ව එනම් කර්මාන්ත වැසීම සහ නතරකිරීම කථිකාකරන ලදි.

මෙම වාර්තාව මගින් ඉහත සඳහන් කළ මාතෘකා යටතේ කරන පසුවිපරමක් වන අතර විශේෂ අවධානයක් වැටුප් ගෙවීම්, ආධාරක ක්‍රමවේද සහ රැකියා ඉවත්කිරීම්. මෙහිදී විශේෂයෙන් කාම්බෝජය, ඉන්දියාව, මියන්මාරය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන රටවලට අවධානය යොමුකර ඇත. එසේම සුවිශේෂීවම, ශ්‍රම වෙළඳපලේ පවතින වෙනස්කොට සැළකීමේ පිලිවෙත් හඳුන්වාදෙන අතර ඒවා වසංගතය නිසා වූ කෙටිකාලීන බලපෑම් (ඇඟළුම් සේවකයන් මත) සහ රැකියා ලබාගැන්මට ශ්‍රමිකයින් වූ බලපෑම විස්තර කෙරේ. මේවා වර්තමානයේ පවතින සාමාජීය අසමානතා හෙවත් වයස, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, ආගම, රැකියාවේ ස්වාභාවය, වැටුප් මට්ටම සහ කර්මාන්තවලට ඇති භූගෝලීය දුර මත වූ නව වෙනස්කම් කොට සැළකීම සහ වෘත්තීය සංගම් විනාශ කිරීමට දරන උත්සහයන් (රාජ්‍ය සහය සහිතව හෝ රහිතව සෘජුව හෝ වක්‍රාකාරව) වන අසමානතා වේ.

මෙම වාර්තාව පහත කොටස්වලට වෙන්කර ඇත.

| | | |
|---|---|---|
| පළමු කොටස | - | ඉහත රටවල රට වසා දැමීමේ තත්වය පිළිබඳ විමසීම කරයි. |
| දෙවන කොටස | - | ගෝලීය ඇඟළුම් කර්මාන්තයේ වර්තමාන තත්වය පිළිබඳ දළ විශ්ලේෂණය. |
| තෙවන කොටස | - | ආසියානු ඇගළුම් සේවකයින්ගේ තත්වය සංක්ෂිප්තව. |
| සිව්වැනි කොටස | - | වැටුප් බෙදා දීම, වැටුප් නොවන ආධාරක ක්‍රමවේද. |
| පස්වැනි කොටස | - | ඇගළුම් ක්ෂේත්‍රයේ රැකියාවලින් ඉවත් කිරීමේදී සිදුවන වෙනස් කොට සැළකීම විසතර කිරීම. |
| සයවන කොටස | - | ආහාර සුරක්ෂිතතාව |
| සත්වන කොටස | - | සෞඛ්‍ය සේවා |
| අටවන කොටස | - | සමාප්ති සටහන |

## පළමු කොටස

# වසංගතය නිසා අර්ධ හා පූර්ණ රට වසා දැමීමේ තත්වය

පළමු නිකුතුව දෙයාකාර රාජ්‍ය ප්‍රතිචාර දැක්වීම පිළිබඳ සහ ඒවායේ විවිධාංගීකරණය වූ බලපෑම් දක්වන ලදි. උදාහරණයක් ලෙස ඉන්දුනීසියාව සහ කාම්බෝජය අර්ධ වසා දැමීමකටද ශ්‍රී ලංකාව සහ ඉන්දියාව පූර්ණ වසා දැමීමකට ලක්විය.

ඉන්දුනීසියාවේ අර්ධ වැසීම සෞඛ්‍ය අමාත්‍යංශ අනු දැනුම සහිතව ප්‍රාදේශීය රජයන් විසින් විශාල පරිමාණයේ සමාජ සීමා කිරීම් මඟින් කරන ලද අතර කාම්බෝජයේ මධ්‍යසාර වෙළඳසැල්, සුදු පොළවල්, ආහාර අවන්හල් ආදිය වසා දමන ලදි. මියන්මාරයේ රජය දැනුම් දුන්නේ දැඩි සමාජ දුරස්ථභාවය පවත්වාගන්නා අතර අනිවාර්ය නිරෝධායන ක්‍රියාවලියක් සංචාරකයින් සඳහාද එසේම තහවුරු කරගත් රෝගීන් හමුවූ ප්‍රදේශවල, අවශ්‍ය ප්‍රදේශ සහ ගොඩනැගිලි, මාර්ග වසා දැමීමකටද, "නිවසේ රැදෙන්න" යන ක්‍රියාවලිය සහ ඇඳිරිනීති අවශ්‍ය විට යොදමින් පාලනය ගෙන යන ලදි. මෙම රටවල ඇගළුම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීත්වය දිගටම පවත්වාගෙන යාමට අවසර ලබාදී තිබුණු අතර සමහර නීති මූලිකව ඉලක්ක කර තිබුණේ සමාජ දුරස්ථභාවය කර්මාන්තශාලාතුල පවත්වා ගැනීමටය.

පූර්ණ වසා දැමීම ඉන්දියාවේ ජාතික වසාදැමීමක් ලෙස මාර්තු 25 සිදු වූ අතර සියළු සේවා අත්‍යවශ්‍ය සේවා සහ කර්මාන්තශාලා සියල්ල හදිසියේම නවතා දමන ලදි. අප්‍රේල් 15 සිට සීමාකාරී ලෙස නීති සැහැල්ලු කිරීම් ප්‍රකාශයට පත්කරන ලද අතර ප්‍රදේශ වර්ණ කේත මගින් රතු, තැඹිලි, කොල ලෙස නම්කරන ලද්දේ තහවුරු වූ රෝගීන් ප්‍රමාණය අනුවය. එයට සමානව ශ්‍රී ලංකාව, දිවයින පුරා ඇඳිරි නීතිය මාර්තු 20 සිට යොදන ලද අතර එය දින 52ක රටපුරා වූ ඇඳිරි නීතියක් ලෙස මැයි 11 ක්‍රියාත්මක කර අවධානමේ ප්‍රමාණයට අදාළ සැහැල්ලු කිරීම් කර ඇත.

මෙසේ ඉන්දියානු සහ ශ්‍රී ලංකාවේ පූර්ණ වසාදැමීමකට ලක් වුවද AFWA හවුල්කරුවන් දැනුම් දුන් පරිදි සමහර ඇඟළුම් කර්මාන්තශාලා නීත්‍යානුකූලව (PPE) පුද්ගල සුරක්ෂිත උපකරණ කට්ටල සහ සෞඛ්‍ය සේවකයින්ට අවශ්‍ය ඇඟළුම් නිපදවීම සඳහා රජයේ අනුදැනුම සහිතව ක්‍රියාත්මක විය. මෙය අර්ධව වසා දැමුණු රටවල ඇඟළුම් කර්මාන්තශාලාවල ක්‍රියාකාරීත්වයට සමානය. එහෙත්, නීති විරෝධී ක්‍රියාවලි සිදුවූ අවස්ථා වාර්තා වේ. උදාහරණයක් ලෙස ඉන්දියාවේ බෙන්ගලයුරුහි ඇඟළුම් කර්මාන්තශාලා PPE නිපදවීමට අවසර පත් ලබාගත් මුත් තවදුරටත් ඇඟළුම් නිපදවීම කරන ලදි. එය පොලිසියේ නිරීක්ෂණයට පසු පූර්ණව වසා දැමීමට ලක් විය. වසාදැමීමේ නීති ක්‍රමාණුකූලව ලිහිල් වීමේදී ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ සමහර ප්‍රදේශ එනම් බෙංගලූරුලු, තිරුපූර්, ගුර්ජාන්, කොල්කටා සහ ලුඩයිනා හි සීටා සහිතවද ඇඟළුම් කර්මාන්තශාලා විවෘත කර ඇත. එහෙත් ගුජරාට් ප්‍රදේශයේ ක්‍රියාකාරීත්වය නැවත අරඹා නැත.

දෙවන කොටස

# ගෝලීය ඇඟළුම් කර්මාන්තය : වර්තමාන ස්වාභාවය

වර්තමානයේ ඇඟළුම් කර්මාන්තය අමුද්‍රව්‍ය ලබාගැනීමේ අපහසුව සහ යුරෝපීය සහ උතුරු ඇමෙරිකානු රෙදි වෙළඳපලේ ඉල්ලුම අවම වීම නිසා සැපයුම් අවිහිරතාවයට පත් වී තිබේ. චීනයේ පරිභෝජනය නැවත පනගැන්වී තිබුණද, කර්මාන්තශාලා සංගණනයන් [2] අනුව ඉදිරි මාස තුළ අභිමත වියදම් පහත වැටීමට හැකියාව ඇත. වෙළඳාම් නොවූ පවතින රෙදිපිලි නිසා ඉතා විශාල වට්ටම් සහිත වෙළඳාම් රටාවක් දැකිය හැකි අතර එය තවදුරටත් ඇඟළුම් නිෂ්පාදකයින් සහ සේවකයින් ඉතා අවධානම් තත්වයට හෙලිය හැක. එසේම කොවිඩ් - 19 වසංගතය බොහෝ සන්නාම බංකොලොත්භාවයට පත්කර ඇති අතර එම නිසා ඒවා ඈවරකිරීමට, ප්‍රතිව්‍යුහ ගතකිරීමට සහ විකිණීමට භාජනය වේ. පසු කොවිඩ් වසංගත කාලය බොහෝ විට ගෝලීය සැපයුම් දාමයේ ප්‍රතිව්‍යුහගත කිරීම, ළඟින්ම ඇති කර්මාන්තශාලා මගින් ඇඟළුම් ලබාගැනීම, නිෂ්පාදනය අඩුකිරීම සහ නිෂ්පාදන ක්‍රියාවලිය සන්නාමවල දැඩි පාලනය තුල නව තාක්‍ෂණික ආධාර සහිතව අවම ස්ථිර භාවයක් පවත්වා ගැනිම ආදී ලක්‍ෂණ වලින් සහිත විය හැක. [3]

වසංගතය තුළ වර්තමාන නිෂ්පාදන බොහෝ විට ලබා තිබූ ඇනවුම් සම්පූර්ණ කිරීමට, ඉදිරි වර්‍ෂය සඳහා සැකසීම, PPE නිපදවීම සිදුකරණ ලදි. නව ඇනවුම් සන්නාම මගින් ලබාදීම පහත වැටී ඇති අතර එය ඉදිරිකාලයේ වැඩ කළ හැකි තත්වය පිළිබඳ අවබෝධයක් ලබාදේ. පළමු නිකුතුවේ අවධාරණය කළ පරිදි සන්නාම ඇනවුම් අවලංගු කිරීම, ඇනවුම් කල් දැමීම මඟින් ඇඟළුම් නිපදවන රටවල අර්බුධය උත්සන්න කර ඇත. එය නිසා කුඩා ලාභ සහිතව නිෂ්පාදනයේ යෙදුණු නිෂ්පාදන ආයතන දැඩි අර්බුධයකට ලක් වී තිබේ. එල්ල වූ මහජන විරෝධතා නිසා සන්නාම කිහිපයක් දෙන ලද ඇනවුම් සඳහා මුදල් ගෙවීමට එකඟ වී ඇති අතර එසේ කිරීමට බලකිරීම බොහෝ සන්නාම සඳහා සිදුවේ.

## තුන්වන කොටස

# ආසියාතික ඇඟළුම් ශ්‍රමිකයන්ගේ තත්වය

"මෙම මගේ පවුල කොතෙක් කල් මෙම අර්බුධය තුළ යෑමට හැකි දැයි කණස්සල්ලෙන් පහසුවෙමි. අපගේ කොන්ත්‍රාත්කරු මසන ලද ඇඳුම් සඳහා ගෙවීම් නතර කර ඇති අතරම නව ඇනවුම් ලබාදී නොමැත. මගේ ස්වාමි පුරුෂයා දෛනික වැටුප් ලබන්නෙක් වන අතර ඔහු මාර්තු මස අග සතියේ සිට රැකියාවක නොමැතිව පසුවේ. අපට දරුවන් දෙදෙනෙකු සහ වයස්ගත දෙමාපියන් සිටී. ඔවුන් බලාගැනීම සිදුවන අතරේ අප ඉතා අවම ලෙස ආහාර ලබා ගනිමු. මේ මාසය සඳහා නිවාස කුලිය, විදුලි බිල ගෙවීමට නොහැකි වූ නිසා අපට මෙහි සිටින ණය ලබාදෙන්නෙකුගේ ණය ගැනීමට සිදුවී තිබේ. එම නය වලට සරිලන සේ අපට දැන් සේවය ලබාදීමට සිදුවී තිබේ."

අනු, තිරුපූර්හි ඇඟළුම් සේවක

ඇඟළුම් අමුද්‍රව්‍ය ලබාගැනීමේ හිඟතාවය නිසා ඉන්දුනීසියාව, කාම්බෝජය සහ ශ්‍රී ලංකාව ගෝලීය සැපයුම් දාමයේ කඩාවැටීම නිෂ්පාදනය සහ ජීවිකාවලට බලපෑම් එල්ලකර ඇත. රාජ්‍ය විසින් යොදනලද වසාදැමීම් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ඉවත් වී ඇති හෙයින් AFWA හවුල්කරුවන් මගින් ලැබෙන වාර්ථා අනුව බොහෝ කර්මාන්තශාලා අමුද්‍රව්‍ය හිඟය සහ ඉල්ලුම අවම වීම මත වැසීයාමේ තත්වයක පවතී.

මෙය අසමමිතික ලෙස ශ්‍රමිකයන්ට බලපාන අතර ඔවුන් දරිද්‍ර මට්ටමේ වැටුප් ලබන අතර ආහාර, නිවාස ණය ගෙවාගැනීමේ, පාසල් ගාස්තු ආදිය ගෙවීමට අරගලයක නිරත වී සිටී. සීමිත රාජ්‍ය මැදිහත් වීම තවදුරටත් තත්වය බරපතල කර ඇති අතර එමඟින් බොහෝ සේවකයින් ණය වීමකට සහ අධික පොලිය සහිතව දෛනික ගෙවීම පවා සිදුවන තත්වයකට ඇද දමා ඇත.

වෘත්තීය සංගම් අවධාරණය කරන්නේ මෙම කොවිඩ් - 19 අර්බුධය ළමා ශ්‍රමිකයින්, වහල් ශ්‍රමිකයින් සහ මිනිස් ජාවාරම් ඉහළ යාමේ තත්වයක් සහ ඇඟළුම් ශ්‍රමිකයින් අනෙකුත් රැකියා වලට මෙන්ම ලිංගික සේවය සඳහා පෙළඹවීමට ඉඩ ඇත.

පහත කොටස් අතිශයින් සැළකිය යුතු ප්‍රධාන කාරණා වන වැටුප් සඳහා මුදල් ගෙවීම, ආර්ථික සහයෝගය, රැකියා නැවැත්වීම, ආහාර සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය සේවා සඳහා ඇතුල් වීම ආදී කාරණා සබැඳිව අවධාරණය කර තිබේ.

## සතරනව කොටස

# වැටුප් සඳහා මුදල් ගෙවීම සහ ආධාරක ක්‍රියාවලිය

රැකියාවලින් ඉවත් කිරීම සහ වැටුප් ගෙවීම විශාල ලෙස රඳාපවතින්නේ රට වසාදැමූ කාලය තුල නිෂ්පාදන ක්‍රියාවලියේ තත්වය මතය.

ඉන්දියාවේ සම්පූර්ණ වසාදැමීමක් සිදුවූ අතර සිදුකළ කාලය සඳහා වැටුප් ගෙවීම පිලිබඳව අස්ථාවර තත්වයක් උද්ගතවී පවතී. ස්වදේශී කටයුතු පිලිබඳ අමාත්‍යංශ වෘත්තීය සමිතිය මගින් උපදේශන ලබාදුන්නේ සේවායෝජකයන් සම්පූර්ණ වැටුප ගෙවියයුතු අතර රැකියා ඉවත්කිරීම සඳහා අනුමැතිය නොමැති බවය. මෙය බොහෝ ආයතන මගින් ක්‍රියාවට නගා නොමැති අතර එම උපදේශකත්වය සති කිහිපයකට පසු ඉවත්කරන ලදි. [4] ශ්‍රී ලංකාවේ රජය විසින් සේවා යෝජකයින්ගෙන් රැකියා ඉවත් නොකිරීමට පොරොන්දු ලබා ගත් අතර ඔවුන්ට අර්ධ වැටුපක් හෝ රු. 14,500 සියළු සේවකයින්ට ගෙවීමට අප්‍රේල් මස සිට එකඟ බරගන්නා ලදි. එහෙත්, මෙම පොරොන්දුවල ප්‍රතිලාභ ස්ථිර සේවකයන්ට පමණක් බොහෝ දුරට ලබාදී තිබේ.

අර්ධ ලෙස වසැදැමූ රටවල, කර්මාන්තශාලා ක්‍රියාත්මක කිරීමට අවසර ලැබුණ අතර බොහෝ රැකියා ඉවත්කිරීමේ සිද්ධීන් වාර්ථා වේ. මෙය බොහෝදුරට අර්බුධයේ පෙර ආක්‍රමණික තත්වය නිසා ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම නිසා අමුද්‍රව්‍ය අවසන් වීම සහ ලබා ගත් ඇනවුම් අවසන් කිරීම නිසා වේ.

ඉන්දියාවේ අහමහාත් සහ ලුඩිහියිනා කලාපවල කර්මාන්ත සංසරණය වන සංක්‍රමණික සේවක ජනගහනය මත හා අවිධිමත් කොන්ත්‍රාත්තු මත පදනම් වේ. මෙහි වෙළඳපලේ ඉතා සුළු වෙනසකදී පවා රැකියාවලින් ශ්‍රමිකයින් පහ කිරීම සාමාන්‍යකරණය වී තිබෙන නිසා රැකියා නීත්‍යානුකූලව ඉවත්කිරීම සිදු නොවේ.

දහස්ගණනක් සේවකයින්ගේ ජීවනෝපාය ගෝලීය වෙළඳපලේ වෙනස්කම් මත සිදුවන අතර මෙම වසංගතයේ අස්ථිතාවය ඔවුන්ට තවදුරටත් දරුණු ආගාධයකට යොමුකර තිබේ.

මෙම වසංගතය හමුවේ මූලිකම ආධාර ක්‍රමවේදය මෙම ශ්‍රමිකයින්හට වන්නේ ඔවුන්ගේ වැටුප් ගෙවීම නියමිත කාලයට සිදුකිරීමය. සන්නිවේදන තොරතුරු සහ AFWA හවුල්කරුවන්ගේ සහ සහයෝගය දක්වන්නන් වාර්තාකරන පරිදි අප වැටුප් ගෙවීමේ සහ වැටුප් නොවන ආධාර ආදියේ මූලික ප්‍රමණතා හඳුනාගෙන සිටිමු. මෙම ප්‍රවණතා සමාප්ති ලෙස හෝ කාණ්ඩ ලෙස සීමාකළ නොහැක. කෙසේ වුවද ඒවා මතුවෙමින් පවතින කාරණ පිලිබඳ දර්ශක ලෙස ගත හැකිය. මේවා ශ්‍රමිකයින් මුහුණ දෙන සහ මූලික බැඳීම් වලින් සේවායෝජකයින් මගහැරයාම දක්වයි.

## මුළු ගෙවීම

"මුළු ගෙවීම" මෙම වාර්තාවට අනුව සඳහන් කරන්නේ මූලික වැටුප ප්‍රසාද දීමනා, අතිකාල දීමනා හෝ දීමනා සහිතව හෝ රහිතවය. සියළු ශ්‍රමිකයන්ගේ මූලික වැටුප ගෙවීම වසංගත සමයතුළ සිදුකළ හැකි අවම කාර්යයක් වේ. බොහෝ ඇඟළුම් ශ්‍රමිකයින් හට ඉතා අඩු තැන්පතු සහ දරිද්‍ර මට්ටමේ වැටුප් සහිතය. එසේම රජය මගින් ඔවුන්හට දීමනාද නොලැබේ. බොහෝ රටවල මෙය ගෙවීම ස්ථිර සේවකයන් හට පමණක් සීමාවී ඇති අතර එම නිසා ශ්‍රම බලකායෙන් බොහෝ පිරිසක් ඉවත්කර ඇත.

- ඉන්දුනිසියාව සහ කාම්බෝජයේ කර්මාන්තශාලා මෙහෙයුම් ක්‍රියාවලිය පවත්වාගෙන ගිය අතර රැකියා නැවතීමක් නොමැතිව මාර්තු සහ අප්‍රේල් දෙමස සඳහා සම්පූර්ණ වැටුප කොන්ත්‍රාත්තු මදනම නොසළකා සේවකයින්ට ගෙවා ඇත.

- ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශ (උතුරු පළාත, ඌව පළාත සහ සබරගමුව පළාත්) තුළ මාර්තු සහ අප්‍රේල් මාස දෙක සඳහා මූලික වැටුප සම්පූර්ණයෙන් ගෙවා ඇත.

## අර්ධ ගෙවීම්

බොහෝ අවස්ථාවලදී සේවකයින් ඔවුන්ගේ මූලික වැටුපේ සම්පූර්ණ ප්‍රමාණය ලබාගෙන නොමැත. එය අර්ධ ගෙවීම ලෙස මෙම වාර්ථාවේ සඳහන් කරයි. ද්විපාර්ශවික හෝ ත්‍රිපාර්ශවික සාකච්ඡා මඟින් මෙම ගෙවීම කථිකාකර ඇත. එසේ වුවද ශ්‍රමිකයින්ගේ කේවල් කිරීමේ හැකියාව වසංගත සමයේ වූ අස්ථාවර ස්භාවය මත සූරා කෑමකට ලක්වී තිබේ. සේවකයන් බලහත්කාරයෙන් මෙම වැටුප් කප්පාදුවට එකඟ වී ඇත්තේ රැකියා අහිමිවීමේ සහ කර්මාන්තශාලා වැසීයාමේ අවධානම නිසාය.

- ඉන්දුනිසියාවේ සහ මියන්මාරයේ කර්මාන්තශාලා මාර්තු මස සිට පූර්ණ ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කළ අතර ගෙවිය යුතු මුදල පිළිබඳ වැඩකරන පැය ගණන සහ නිෂ්පාදන ප්‍රමාණය සේවායෝජයන් සහ සේවකයින් අතර සාකච්ඡා මගින් තීරණය විය. ඒ හේතුවෙන් විවිධාකාර වූ අර්ධ ගෙවීම් කර ඇත. එනමුත් බොහෝ තීරණ සේවකයින්ගේ හා වෘත්තීය සමිති එකඟතාව රහිතව සේවායෝජකයා තීරණය කර ඇත.

- මියන්මාරයේ බොහෝ සේවකයින් මූලික වැටුපට වඩා අඩු වැටුප් ද්විපාර්ශවික සාකච්ඡා මත හා පූර්ණ වැටුප ඉල්ලීම මගින් රැකියා අහිමි වේයැයි බියෙන් එකඟතාව පළකර තිබේ. මින්ග්ලාර්ඩොන් නගරයේ සේවකයින්ගෙන් 40 - 60%ක ප්‍රමාණයේ පමණක් ඔවුන්ගේ මූලික වැටුපෙන් ගෙවා ඇත. වැඩ නැවැත්වීම අප්‍රේල් මස සහ මහජන නිවාඩු (ජල උත්සවය) නිසා සහ කොවිඩ් සම්බන්ධ අධිකරණ නිසා සිදුවූ බැවින් එසේ වැටුප් කපා දමන්නේ රජයේ නියෝගයද නොසලකාය.

- ශ්‍රී ලංකාවේ බොහෝ ශ්‍රමිකයින් නිදහස් කර්මාන්ත කළාපය (FTZ), බස්නාහිර පළාත තුලවූ අතර ඔවුන්ට ලැබී ඇත්තේ මාර්තු සහ අප්‍රේල් මස සඳහා අර්ධ වැටුප් හෝ අර්ධ වැටුපක් මාර්තු මසට සහ අප්‍රේල් මාසයට වැටුප් රහිතවය.

- ඉන්දියාවේ බෙන්ග්ලූරුලු හි බොහෝ ඇඟළුම් ශාලා අර්ධ වැටුප් වසාදැමූ කාලය සඳහා සහ අප්‍රේල් සඳහා වැටුපක් නොගෙවා ඇත. තවත් කර්මාන්තශාලා අප්‍රේල් මස අර්ධ වැටුප ලබාදුන්නේ නැවත සේවයට වාර්ථා කළ සේවකයින්ට පමණි. මෙම අත්තනෝමතික තත්ව මත නිවාසවලින් පිටවීමට නොහැකි (වසංගතය නිසා) සේවකයින්ට කළනොහැකි වූ අතර ඔවුන්ට යාමට පොදු ප්‍රවාහන හෝ ආයතන මගින් ලබාදෙන ප්‍රවාහන පහසුකම් නොමැති නිසා වැටුප අහිමි විය. එසේම අපනයන කර්මාන්තශාලාවල ස්ථිර සේවකයින්හට යෝජනා තුනක් ඉදිරිපත් කර ඇත. ඒවානම් මාර්තු වැටුපට වැටුප් අඩු කිරීමක්ද/ සම්පූර්ණ ගෙවීමක් නමුත් ඉරිදා දින අමතර වැටුපක් රහිතව සේවය කිරීම හෝ පූර්ණ වැටුප මාර්තු සඳහා මුත් ඉදිරි මාසවල වැටුප් කැපීම වේ.

- කොල්කටාවේ මේස් ශ්‍රමිකයින් 30 - 40%ක ප්‍රතිශත වැටුප් අප්‍රේල් මස සඳහා ලබාදී ඇති අතර ඉදිරි මාසවල වැඩ ලැබුණු විට ඉතිරිය ගෙවන බවට සඳහන්කර ඇත.

## කිසිදු වැටුපක් නොගෙවීම

වැටුප් නොගෙවීම කරුණු 3 ක් හේතුවෙන් ඇතිවී ඇත.

- පළමුව, කර්මාන්තශාලා වසා දැමීම නිසා ඉන්දුනිසියාවේ ජාවාහී දහස් ගණනක් සේවකයින්ට බලපෑම් ඇති විය.

- දෙවනුව, වැටුප් නොගෙවීම ශ්‍රමිකයින්ගේ තත්වය මත සිදුවිය හැක. එහිදී දෛනික වැටුප් ලබන්නන් සහ කොන්ත්‍රාත් සේවකයින් අසමමිතික ලෙස සියළු රටවල පීඩාවට පත්විය. එම කොටසට බොහෝසෙයින් සංක්‍රමණික සේවකයින් වන අතර ඔවුන් වෙළඳපල වෙනස් වීම් වල අවධානමට ලක්විය හැකි අතර ඔවුන් රජයේ අනිවාර්‍ය සමාජ ආරක්ෂණ ක්‍රියාවලි සහ දීමනා බොහෝ දුරට ඔවුන් ලබා නොගනී.

- තෙවැනුව, වෘත්තීය සමිති දැනුම්දෙන පරිදි බොහෝ කර්මාන්තශාලා හිමිකරුවන් සහ කොන්ත්‍රාත් කරුවන් සේවකයින් අත්හැරීමට සහ සන්නිවේදනය කපා හැරීමකට ලක්කර සේවකයින්ට මුදල් ගෙවන බවට සහතිකයක් නොලැබී ඇත.

ඉන්දියාවේ තිරුපූර්හි, ශ්‍රමිකයන් ඔවුන්ගේ කොන්ත්‍රාත්තු පදනම නොසළකා කිසිදු ශ්‍රමිකයෙක් වැටුප් ලබා නොමැත. මධ්‍ය මට්ටමේ ගණකාධිවරුන් සහ කළමණාකරුවන් 50 - 60%ක ප්‍රමාණයේ පමණක් වැටුප් ලැබුණ බව වාර්තා කර ඇත. අහමහාත්, ගුරුජාඔන්, ලුඩිහිනා, මුම්බායි, තිරුපූර් සහ සුරාත් වල කොටස් ලෙස වැඩකරන සේවකයින් සහ නිවාස ආශ්‍රිතව වැඩකරන ශ්‍රමිකයින් හට නිමකළ කොටස් සඳහා පෙබරවාරි සහ මාර්තු මාසවල වැටුප් ලබන්නන් සහ කොන්ත්‍රාත් සේවකයින් රට වසා දැමූ කාලය සඳහා ගෙවීම් ලබා නොමැත.

කාම්බෝජයේ සහ ඉන්දුනිසියාවේ වෘත්තීය සංගම් වාර්තාකරණ පරිදි රැකියාවෙන් ඉවත්කරන ලද හෝ අනිවාර්ය නිවාඩු යැවූ සේවකයින්ට වැඩකරන ලද කාලයට වැටුප් ගෙවා නැත.

## උත්සව දීමනා රඳවාගැනීම

ඉන්දුනිසියාවේ රාමසාන් සමය සඳහා උත්සව දීමනා ගෙවීම නිරතුරුවම සිදුවිය යුතු නීතිමය ක්‍රියාවලියකි. මෙම දීමනාව එම උත්සව සමයේ වන අමතර වියදම් පියවා ගැනිම සඳහා සේවකයින්ට අත්‍යවශ්‍ය වේ. මෙම දීමනාව (එක මසක වැටුපට සමානව) බොහෝ කර්මාන්තශාලා අයිතිකරුවන් දැනුම් දී ඇත්තේ ඔවුන් සම්පූර්ණ මුදල ගෙවිය නොහැකි බවය. එසේ නොමැතිනම් කාර්තු ලෙස කොටස් වශයෙන් ගෙවිය හැකි බවය. එම කාලය මාස 8 - 10ක් දක්වා ගත විය හැක. සුකාබුමිනි එක් කර්මාන්තශාලාවක සේවකයින් සේවායෝජකයින්ගේ මෙම තීරණයට විරුද්ධව උත්ගෝෂණය කරන ලදුදේ එය කොටස් 8 න් ගෙවන නිසාවෙනි. පසුව ආයතනය එය එක්වරම ගෙවීම එකඟ වූයේ ඉදිරි තුන් මාසවල වැටුප දින 10 බැගින් පමාවී ගෙවන බවට කොන්දේසි සහතිවය. රජය,

## රජය, කර්මාන්ත සහ සිවිල් සමාජය මගින් වූ වැටුප් නොවන ආධාර

සුපුරුදු වැටුප් ගෙවීම් රහිතව සමහර සේවකයින්ට වැටුප් නොවන ආධාර හෙවත් ගෙවීම්, අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය රජය මගින්, කර්මාන්තශාලා සහ සිවිල් සමාජ ආයතන මගින් ලැබුණි. මෙය අවම ලෙස ආර්ථික පීඩනය දරාගැනීමට සේවකයින්ට සහයක් වුණි. එහිදී ක්‍රියාත්මක වූ මූලික ක්‍රියාපිලිවෙත් නම් ;

**A. වැටුප් නොවන මූල්‍යමය ආධාර**

තිරුපූර්හි කුඩා කර්මාන්තශාලාවල සේවකයින්ට INR 500 - 600ක් එහි සේවායෝජකයන් ගෙවා ඇත්තේ ඔවුන් සමඟ ඇති පෞද්ගලික සබඳතාව මතය. විශාල ආයතන සහල්, පරිප්පු සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සේවකයින්ට ලබාදී ඇත. මෙවැනි සහයෝගය ලබාදීම් බොහෝ සෙයින් අනියම් සේවායෝජක - සේවක සබඳතාවය මත හෙවත් ස්වාමි - සේවක සබඳතාවය නිරූපණය කරන අවස්ථාවකි. එබැවින් එවැනි ආධාර එක සමානව බෙදී ගොස් නොමැත.

**B. සිවිල් සමාජ ක්‍රියාදාම**

බොහෝ NGO සහ වෘත්තිය සමිති AFWA හවුල්කරුවන් කැපවීමෙන් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබාදුන් අතර ඒ සඳහා ආධාර පැතීම කළේ බොහෝ ආසියාතික ඇඟළුම් නිපදවන රටවල රජයන් මගින් ක්‍රියාත්මක කළ ක්‍රියාවලි මඳකම නිසාය. ලුඩ්හියානා, ඉන්දියාවේ වැදගත් සමාජ ක්‍රියාකාරී වැඩපිළිවෙලක් දියත් වුණි. එහිදී සියළු සේවකයින්ට ප්‍රජා මුළුතැන්ගෙයක් මගින් ආහාර ලබාදුනි. එය විශාල සහයෝගයක් ලබාදුන් අතර එම නිසා වෘත්තිය සමිතිවලට වැටුප් සහ රැකියා පිළිබඳ කළයුතු කටයුතු කිරීමට ඉතා වැදගත් පිටුවහලක් වූයේ එමගින් සේවකයන්ගේ කුසගින්න ගැටළුවක් නොවීමෙනි. එහෙත් මෙවැනි සමාජ ක්‍රියාකාරීත්ව ලුඩ්හියානා, පන්ජාබය තුළ වන සංස්කෘතිකමය තත්ව නිසාය. උදාහරණයක් ලෙස මෙවැනි ආහාර ලබාදී ආරක්‍ෂණ ලබාදීම ගුජරාට්හි තත්වයට ප්‍රතිවිරුද්ධවේ. එහි ප්‍රජා කටයුතු දුර්වල අතර රජය සහ කර්මාන්තවල සහයෝගය බෙහෙවින් පහළ මට්ටමක පවතී.

**C. රාජ්‍ය මඟින් ලබාදෙන වැටුප් ආධාරක**

බොහෝ සේවකයින් රැකියා නොමැතිවීම නිසා සහ වැටුප් කප්පාදුව නිසා සමහර රජයන් වැටුප් ආධාරක ලබාදීමට කටයුතු කරන ලදි. මෙවැනි ක්‍රියාවලි සඳහා යොදන ලද මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අතර වෘත්තීය සමිති කණගාටු වන්නේ අත්‍යවශ්‍ය සේවකයින් අදාල වැඩසටහන් මඟින් ආවරණය නොවිය හැකි බැවිනි.

### කාම්බෝජය

මෙහි රැකියා අත්හිටුවන ලද සේවකයින්ට USD 70ක් එනම් අවම වැටුපෙන් 37% ක්ද රජය විසින් එහි USD 40 ක්ද සේවායෝජකයා විසින් ඉතිරි USD 30 ක්ද ගෙවන ලදි. එනමුත් රජය විසින් ගෙවන කොටස සම්පූර්ණවම ගෙවීම නොකර ඇති බැවින් එම USD 70 ක්ද ශ්‍රමිකයින්ට ලැබී නොමැති තත්වයක් ඇතිවී ඇත. මෙම ගෙවීම රටේ දරිද්‍ර මට්ටමද පහත තිබෙන අගයක් වන අතර නිවාස සහ විදුලි බිල්පත් විශාල ලෙස ඉහළ ගොස් ඇත.

### ඉන්දියාව

ඉන්දියානු රජය INR 20 ලක්‍ෂක (1% of GDP) සහන පැකේජයක් හඳුන්වා දී තිබේ. එමගින් ආහාර, ණය සහ මුදල් සහන සමහර සේවකයින්ට ලැබෙන අතර එසේම ග්‍රාමීය ප්‍රදේශවල නැවත ගමන් කරන සංක්‍රමණික සේවකයින්ට රැකියා ලබා දීම සඳහාද යොදා ඇත. එය MGNREGA රටාවත් මහත්මා ගාන්ධි ජාතික ග්‍රාමීය රැකියා ක්‍රියාවලිය. එනමුත් මෙම පැකේජය ඇඟළුම් සහ රෙදිපිළි ශ්‍රමිකයින්ට ලබාදී නොමැති අතර එම ක්‍රමවේදය බොහෝ සෙයින් අසාර්ථක වන්නේ එයට ඇතිවී ඇති මානව අර්බුධයට විසඳුමක් නොවන නිසාය. එයට ආර්ථික විශ්ලේෂකයන්ගේ සහ වෘත්තීය සමිතිවල ඉල්ලීම් ලබාදිය නොහැකි අතර ඔවුන් යෝජනා කරන්නේ මාසයකට INR 7000ක මුදලක් මාස 3ක කාලයක් පුරා සෑම නිවසකටම ලබාදිය යුතු බවය. එසේම සෑම ශ්‍රමිකයකුටම මුදල් රහිතව මසකට කිලෝ 10ක ධාන්‍ය මාස 6ක කාලයක් පුරාද ලබාදිය යුතු බවය. ඒ සඳහා වැයවන්නේ 3%ක GDP ප්‍රමාණයකි.

### ඉන්දුනීසියාව

කොවිඩ් - 19 මගින් අවතැන්වූ සේවකයින්ට රජය විසින් IDR 3,550,000ක් වන සහනාධාර පැකේජයක් ලබාදී ඇත. එහෙත් මෙය ලබාගත හැක්කේ සේවකයින් විසින් අන්තර්ජාලයේ පහසුකම් යටතේ කළයුතු පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කිරීමෙන් පසුවය. සේවකයින් සහ වෘත්තීය සමිති රජයේ මෙම ක්‍රියාපිලිවෙල සම්බන්ධයෙන් අප්‍රසාදය පළකරන්නේ මෙම කොන්දේසි සහ විශාල ආධාර ප්‍රමාණයක් මෙවැනි පුහුණු සඳහා යොදවන්නේ සේවකයින් ආහාර සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා අරගලයක යෙදී සිටින විටදීය.

### මියන්මාරය

එහි කම්කරු හා ජනගහන අමාත්‍යාංශය මගින් අප්‍රේල් 30 ප්‍රකාශකරන ලද්දේ සාමාජීය ආරක්ෂණ ප්‍රතිලාභ "ලියාපදිංචි කර්මාන්තශාලා" වල සේවකයින්ට ලබාදෙන බවය. ඔවුන්ට 40%ක වැටුප් ප්‍රමාණයක් රැකියාව නොකර සිටි කාලය සඳහා ගෙවන බවය. එහෙත් අපගේ හවුල්කරුවන් දැනුම් දුන් පරිදි කිසිදු මියන්මාර සේවකයෙක් එම ගෙවීම ලබා නොමැත. බොහෝ සේවකයින් මෙම ක්‍රියා පටිපාටිය පිළිබඳ දැනුවත් නොමැති අතර බොහෝ අවස්ථාවල සේවා යෝජකයින් ශ්‍රමිකයින්ගේ සමාජ ආරක්ෂණ කාඩ් පත් රඳවාගෙන සිටින අතරම ලියාපදිංචි නැති සේවකයින් යොදා වැඩකරන සේවක ප්‍රමාණය ලිඛිත සටහන්වල අඩුවෙන් යොදා ඔවුන්ගේ වගකීම් පැහැරගනිමින් සිටී.

### ශ්‍රී ලංකාව

දෛනික වැටුප් ලබන සේවකයින් ඔවුන්ගේ රැකියා අහිමිවීම නිසා මසකට LKR 5000ක මුදලක් රජය විසින් ගෙවීම කර ඇත.

පස්වන කොටස

# රැකියාවලින් ඉවත්කිරීම

වසංගතය නිසාවූ අමුද්‍රව්‍ය හිඟය සහ වෙළඳපල විචල්‍යතාව යොදාගෙන ඇඟළුම් නිපදවන රටවල සේවකයින් සේවයෙන් නෙරපීමට සේවායෝජකයින් ක්‍රියාකර ඇත. මාධ්‍ය වාර්ථා අනුව ආසියාව පුරා මිලියන ගණනක් සේවකයින්ට රැකියා අහිමිවී තිබේ. කාම්බෝජයේ 110,000 ක්ද, ඉන්දුනිසියාවේ 2.1 මිලියන සේවකයන්ද, ලක්ෂ 10 කට ආසන්න ප්‍රමාණයක් බංගලාදේශයේද මෙම තත්වයට පත්වී ඇත. මෙය තවදුරටත් නිෂ්පාදන කටයුතු කිරීමට අමුද්‍රව්‍ය හෝ තවදුරටත් නිෂ්පාදන කටයුතු කිරීමට අමුද්‍රව්‍ය හෝ මුදල් රහිත ආයතන වසා දැමීම නිසා සිදුවී ඇත.

රැකියාවලින් නෙරපීම තදින් හා නීති ප්‍රකාරව සිදුවී නොමැත. එයට හේතු වන්නේ සේවක - සේව්‍ය සබඳතාවය අනියම් ස්භාවය මතය. එසේම අනිවාර්‍ය නිවාඩු යැවීම තවත් ගන්නා ලද ක්‍රියාවලියකි. මෙය මගින් අසීරුතාවලට ගෙවිය යුතු ගෙවීම් වලක්වාලීමේ උපායක් ලෙස  පාවිච්චිකර ඇත. උදාහරණයක් ලෙස ඉන්දුනිසියාව එය භාවිතාකර ඇත.

රැකියා ඉවත් කිරීම මගින් සේවක කැමැත්ත පිලිබඳ නව ප්‍රවණතා හෙලිවෙමින් පවතින අතර පවතින සමාජ විෂමතා ප්‍රවණතාද නිරාවරණය වෙමින් පවතී. බොහෝ රැකියා ඉවත් කිරීම් තත්වය ආයතනික තත්ව මත රදාපවතින අතර කම්කරු සබඳතා ඉහල නම්‍යතාවයක් යුතු විය බවට ආයතන දක්වා ඇත. එමගින් ආර්ථිකයට සාපේක්ෂව කම්කරු නීති ඉතා අඩු තත්වයක පවතා ගතයුතු අදහසද ලබාදී තිබේ.

## A. කොන්ත්‍රාතුවේ ස්භාවය

පුහුණුවන්නන්, දෛනික වැටුප් ලබන්නන්, කොන්ත්‍රාත් සේවකකයින් සහ නිවාස ආශ්‍රිත සේවකයින් බොහෝවිට පළමුව රැකියාවලින් ඉවත් කරන නොටසට අයත්ය. ඉන්දියාවේ ගුජරාටිය වැනි ප්‍රදේශවල රැකියාවල විචල්‍ය සහ අනියම් ස්භාවය නිසා එසේ පූර්ණව රැකියාවලින් ඉවත්කරන ලද ලෙස කාණ්ඩ කිරීම අපහසුය. තිරුපූර්හි කොටස් ලෙස වැඩකරන ලද සේවකයින් දරුණු ආර්ථික අවපාතයකට පත්වී ඇත්තේ ඔවුන්ට වැඩ නොමැතිවීම නිසාය.

ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ නිදහස් වෙළඳ කලාපයේ මිනිස් බල සේවකයින් සහ ඌව, සබරගමුවේ පුහුණුවන්නන් (මාස 6කට වඩා අඩු කාලයක් සේවා කළ) සේවකයින්හට රැකියාවලට නොපැමිණෙන ලෙස දන්වා ඇත. ඉන්දුනිසියාවේ පුහුණුවන්නන් සහ වසරකට වඩා අඩු අත්දැකීම් සහිත සේවකයින් බොහෝවිට නෙරපා ඇත.

## B. කර්මාන්තශාලා වෙතවූ අවකාශමය දුරස්ථභාවය

රටවසා දැමීමේ නීති ක්‍රමිකව සැහැල්ලුවෙමින් පවතී. අතර කර්මාන්තශාලාවලට ලඟින්ම සිටින සේවකයින් පළමුව රැකියාවට කැඳවා ඇත. මෙය දෙන ලද අන්තර් පළාත් සහ අන්තර් ප්‍රාන්ත ගමන්කිරීමේ සීමාකිරීම් නිසා බලාපොරොත්තු වියයුතු තත්වයකි. බෙන්ගුරුලු හි සේවකයින් එහි නගරබද වෙසෙන නිසා නැවත සේවයට වාර්තාකර ඇති අතර ගුරුගැම් හි සේවකයින් දිල්ලියේ සිටින බැවින් ඔවුන්ට නැවත පැමිණීම කළ නොහැකි වී තිබේ. තිරුපූර්හී සේවකයින් බොහෝදුරට එයට අසල්වැසි නගර ප්‍රදේශවල වන ඉරෝඩ් සහ කොයිබතූර් සිටින බැවින් නැවත විවෘත කරන ලද කර්මාන්තශාලා වෙත පැමිණීමට නොහැකි වී තිබේ. පෞද්ගලික බස්රථ කර්මාන්තශාලා මගින් පෙරදී ලබාදුන් මුත් ඒවා දැන් ක්‍රියාත්මක නොවේ. පොදු ප්‍රවාහන සේවා සීමිත මාර්ගවල පමණක් ධාවනය වන අතර සේවකයින් කුලීරථ මගින් කර්මාන්තශාලා වෙතද පැමිණේ. මෙවැනි පෞද්ගලික රථ 5 - 8 අතර සේවක සංඛ්‍යාවක් පමණක් ගෙනයා  හැකි බැවින් සේවකයින් මත අමතර වියදමක්ද පටවයි. එසේම සමාජ දුරස්ථභාවය නොපවත්වාගැනීම නිසා ඔවුන්ගේ ජීවිතද අවධානමක හෙළා ඇත. සේවකයින් අවධානම් තත්ව සහ අමතර වියදම් දරා නැවත පැමිණීමට උත්සහ දරන්නේ බොහෝ කර්මාන්තශාලා නැවත පැමිණීමට වෙන්කරනන ලද දිනවලට නොපැමිණිය හොත් රැකියාවලින් නෙරපන බවට දැනුම් දී ඇති නිසාවෙනි. එමනිසා රජය විසින් කොවිඩ් - 19 වසංගතය පැතිරීමට ගත් ක්‍රියාමාර්ග කර්මාන්තශාලා මගින් වැරදි ලෙස යොදා සේවකයින් සූරාකෑමකට ලක්කර ඇත.

එසේම බොහෝ අවස්ථාවල කර්මාන්තශාලාවලින් බැහැර දුර ගම්මානවල සිටින සේවකයින්ව ඔවුන්ගේ සමාජය මගින් නැවත නොයාමට පෙළඹවමින් සිටී ඒ ඔවුන්ව කොවිඩ් රෝගයට ගොදුරු වේයැයි බියෙනි. එය ගමනාගමනයේදී හෝ කර්මාන්තශාලා තුළ සිදුවිය හැකි ප්‍රවණතාව පවතී. එම නිසා කර්මාන්තශාලා අසල සිටින සේවකයින් දුර සිටින සේවකයින්ට වඩා වාසියක් ලබා ඇත.

## C. වයස

කොරෝනා රෝගයට වයස්ගතවීම අවධානම් බැවින් ශ්‍රම වෙළඳපොලේදී වයස්ගත සේවකයින් වෙනස්කොට සැළකීමට භාජනය වී තිබෙන්නේ ඔවුන් නැවත යාමට වූ කැමැත්ත නොසළකාය.

බෙංගරුලුහි වෘත්තිය සමිති වාර්ථාකරන පරිදි වයස 40ට වැඩි කාන්තාවන් නැවත සේවයට පැමිණෙන ලෙස දන්වා නොමැති අතර ඒ සමානව ඌව සහ සබරගමුව පළාත්, ශ්‍රී ලංකාවේද වැඩිහිටි සේවකයින් නිවසේ රැදෙන ලෙස දන්වා ඇත. එසේ වුවද මෙම මස මුලදී සාකච්චාකර ඇත්තේ ඔවුන්ට හිමි ගෙවීම් කිරීමටත්, කුඩා මූල්‍යමය ආධාරයක් ලබාදීමට වුවද එය ක්‍රියාත්මක වීම තවමත් අවිනිශ්චිතය. සේවායෝජකයන්ද තරුණ සේවකයින් යොදා ගැනීමට කටයුතු කර ඇති අතර එමගින් ඔවුන් පවුල්වල ආර්ථික අස්ථාවර භාවය ප්‍රයෝජනයට ගෙන ඇත. මෙම වසංගත තත්වය නිසා පවුල් ණයවීමට සහ ඇපයට බැඳුණ සේවයට යෑමත් නව යෞවනයන් පාසල් යෑම මගහැර රැකියා සඳහා කර්මාන්තශාලාවලට යෑමද ආරම්භ වී තිබේ. මෙම අර්බුධකාරී කාලය තුල ඩිජිටල් අධ්‍යාපනයට යොමු වීමට බොහෝ ශිෂ්‍යයන්ට නොහැකි වන්නේ ග්‍රෝපීය දක්ෂිණ ප්‍රදේශයේ ඇති ඩිජිටල් බෙදීම විශාල බැවිනි. එයද බොහෝ පවුල්වල දරුවන් රැකියාකරා යෑමට හේතුවී පවතී. මෙම මතුවෙමින් පවතින තත්වය පිලිබඳ වැදගත් අවස්ථාවක් පහත දක්වා ඇත.

**සිද්ධි අධ්‍යනය : නව යොවුන් දැරිවියන් රෙදි කර්මාන්තශාලා, ඩිංගිගුල්, තමිල්නාඩුවලට බඳවා ගැනීම**

ඩිංගිගුල් හී තමිල්නාඩු රෙදි සහ පොදු වෘත්තිය සමිතිය (TTCU) වාර්ථාකරණ පරිදි බොහෝ රෙදි වියවන කර්මාන්තශාලාවල එහි නවාතැන් පළවල සිට සේවයට පැමිණීමට කැමති ශ්‍රමිකයින් හට පමණක් සේවය කිරීමට ඉඩදී ඇත. එසේ වන්නේ කොවිඩ් - 19 නිසාවූ ගමනාගමන සීමා නිසාය. එබැවින් බොහෝ නව යෞවන ගැහැණු දරුවන් පාසල් යාම අතහැර වයස 14 තරමේදීම වියමන් කර්මාන්තශාලාවල සේවයට යවා ඇත. වැඩිහිටි කාන්තාවන්ට නිවසේ කටයුතු කළ හැකි බැවින්ද ඇල්කොහොල් නිසාවන ගෘහස්ථ හිංසනය ඉහළයාම නිසාද පවුල්වල ගැහැණු දරුවන් රැකියා කරා යැවීම සහ නේවාසිකාගාරවල ඔවුන් රැඳවීම පහසු තත්වයක් උදාකර ඇත. ඔවුන්ගේ වැටුප් පවුල්වල ආර්ථිකයට සීමිත ලෙස දායක වේ.

එසේ වුවද මෙය හේතු ගණනාවක් නිසා අතිශයින් වැදගත් තත්වයකි. පළමුව TTCU කනස්සල්ල පළකරුණුයේ මෙම දැරිවියන් කිසිදා නැවත පාසල් යාම නොකිරීමත් තවදුරටත් සේවය කරන පද්ධතීන්ට නැඹුරු විය හැකි බැවිනි. ඔවුන් මඟින් ලැබෙන අමතර මූල්‍යමය දායකත්වය ඉතා දැඩි ආර්ථික අර්බුදයකට පත්වී ඇති පවුල්වලට අස්වැසිල්ලකි.

දෙවනුව, මෙම කර්මාන්තය මෙවැනි අවිධිමත් ලෙස සැකසුණු ගැහැණු ළමයින්ගේ ශ්‍රමය මත යැපීමේ සම්භාවිතාවක් පවතින්නේ ඔවුන් පරිපාලනයේ බලයට යටත් බව ප්‍රදර්ශනය කරන නිසාවෙනි. බොහෝ දරුවන් දැනටමත් පැ. 16 පමණ වේලා අවධානම් වැඩකරන තත්ව යටතේ සීමිත නිදහසකට යටත්ව වැඩ කරති. තුන්වැනුව, මෙය "සුමංගලී" ක්‍රමවේදය හෙවත් තරුණ ගැහැණු දරුවන් විශේෂයෙන් දාලිත් ප්‍රජාවගෙන් රෙදිවිවීමේ කර්මාන්තශාලාවලට බඳවාගැනීම සිහි ගන්වයි. ඔවුන් බලහත්කාරයෙන් රාඳවා සේවය ලබාගන්නා ලදි. මෙම බඳවාගැනීම දැරිවියන්ගේ කායාක සහ මානසික සෞඛ්‍ය අවධානමක හෙලමින් ඉතා අඩු වැටුප් සහ අධික ශ්‍රම සූරා කෑමකට ලක්වීම නිසා විවේචන වලට ලක්විය. සතරවනුව, මෙම දැරිවියන් ස්ත්‍රී පුරුෂ භාවය මත වූ හංසනය, කායික වාචික සහ ලිංගික හිංසනය ඉහළ යා හැක. ඒවා රැකියාව නොමැතිවීමේ බියෙන් වාර්ථා නොවීමටත් එම රැකියා ඔවුන්ගේ පවුල රැකබලා ගැනීමට මෙම ආර්ථික අර්බුධය හමුවේ ඇති එකම ආදායම් මාර්ගය නිසා නිහඬවීමට ඉඩ ඇත.

**D. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය**

බෙංගරුළු, ඉන්දියාවේ බොහෝ තරුණ මව්වරු නැවත සේවයට පැමිණීමට නොහැකි වී ඇත්තේ කර්මාන්තශාලාවල මාතෘ දීමනා පනත, 2017 මගින් අනිවාර්ය වූ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම තාවකාලිකව වසංගත සමයේ නැවතීම නිසාය. කර්මාන්තශාලා තුළ ළමා සුරැකුම් මධ්‍යස්ථාන යන්න දරුවන් සහිත මව්වරුන්ට රැකියාවලට යාමට වැදගත් සාධකයක් වේ. එමගින් නිවසින් පිටත රැකියා කිරීමට සහ පවුලේ ආර්ථිකයට දායක වීමට හැකිය. මෙම පහසුකම සීමා කිරීම වසංගතය දරුවන්ට පැතිරවීම සීමාකිරීමට අරමුණු කළද එය අමතර මූල්‍යමය බරක් බොහෝ පවුල් වෙත ඇතිකර ඇත්තේ මව්වරුන්ට නැවත සේවයට යාමට නොහැකි නිසා සහ කැමැත්තෙන්ම රැකියාවලින් ඉවත්වීම නිසාය.

**E. කම්කරු සංගම් සාමාජිකත්වය**

මෙම වසංගතය බොහෝ වෘත්තීය සමිති අක්‍රීය කිරීමටද හේතුවක් ලෙස යොදන බවට මයාන් මොඩ් කර්මාන්තශාලාවල, යැංගුන්, මියන්මාරය උදාහරණ දක්වයි. රැකියාවෙන් නෙරපන ලද 571ක් වන සේවකයන්ගෙන් 520ම කර්මාන්තශාලාවේ වෘත්තීය සමිති සාමාජිකයන්ය. මෙය 700ක් පමණ වන වෘත්තිය සාමාජිකත්වය නොමැති සේවකයන්ගේ රැනියා පවත්වාගෙන යාමට ප්‍රතිවිරුද්ධ ක්‍රියාවකි. එය කම්කරු බලය දුර්වල කිරීමට විධිමත් ශ්‍රමිකයින් ඉවත් කිරීමට කටයුතු කිරීමකි. සේවායෝජකයින් කොවිඩ් - 19 හදිසි නීති යොදාගනිමින් පස්දෙනෙකුට වඩා එක් රැස් වීම් වැළැක්වීම නිසා අප්‍රේල් මස වැටුප් නොගෙවීමට ගත් වර්ජන උත්සහයද වියැකී ගොස් ඇත. මෙහිදී වර්ජකයින් අත්තඩංගුවට පත්වූ අතර එමගින් ගම්‍ය වනුයේ තම වැටුපට ඇති අයිතිය වෙනුවෙන් ඔවුන් දඩුවමට ලක්වී ඇති බවය.

කාම්බෝජයේද වෘත්තීය සමිති සේවකයින් විශාල වශයෙන් රැකියා නෙරපීමට භාජනය වී ඇත. එම රජය විසින් එවැනි වෙනස්කොට සැළකීමක් නොකරන ලෙස දැන්වීම් කර තිබියදීය. එසේ වෘත්තිය සමිති විනාශ කිරීම උත්සහ කිරීම සිදුවන බවට උදාහරණයක් ලෙස වෘත්තිය සමිති සේවකයින් ඉවත් කිරීම පිලිබඳ සමාජ මාධ්‍යවල විවේචනය කළ වෘත්තිය සමිති නායෙකයෙකු අත්තඩංගුවට පත්වීම සහ සිරගත කිරීම රජයද එයට සහය දක්වන බවට සාක්ෂියකි. මෙය මගින් මෙවැනි වසංගත කාලයක නිදහස සීමාකිරීමට යෙදීම ගැන බලවත් අවධානයක් යොමු වී ඇත.

F. අවම වැටුප් මට්ටම

ඉන්දුනිසියානු වෘත්තිය නිරීක්ෂණය කළ පරිදි වැටුප් ප්‍රමාණය වැඩි උදාහරණ ලෙස ජකර්ථා වල කර්මාන්තශාලා පළමුව වසාදමන ලදි. එය අඩු වැටුප් ගෙවන ප්‍රදේශවල සාපේක්ෂව ඉක්මණින් කරන ලදි. ටැංගරැන්හි කාර්මික ප්‍රදේශයේ වෙනසකින් තොරව විශාල ලෙස රැකියාවලින් ඉවත් කිරීම සිදුකළ ප්‍රදේශයක් වේ. වෘත්තිය සමිති පවසන පරිදි සාපේක්ෂ ඉහළ වැටුප් මට්ටම එයට හේතු වේ. එසේම සැපයුම්රුවන් ඔවුන්ගේ අඩු අවම වැටුප් ගෙවන කර්මාන්තශාලා පවත්වා ගනිමින් ඉහළ වැටුප් ගෙවන කර්මාන්තශාලාවල ශ්‍රමිකයින් අනිවාර්ය නිවාඩු යැවීමට හෝ රැකියාවලින් ඉවත් කිරීම සිදුකරයි.

G. ආගම

ඉන්දියාව තුල වැඩෙන ජාතිභේදයට සාක්ෂි ලෙස හින්දු සේවකයින් සේවයට ගෙන ඉස්ලාම් භක්තික සේවකයින් 50ක පමණ නොගැනීම ගුජරාටියෙන් වාර්ථා වේ. මෙය දෙස බැලිය යුත්තේ සාමාජ මාධ්‍ය

ඔස්සේ සාමාජීය ලෙස කොන්වි ඇති ප්‍රජාවන් රෝග වාහකයන් ලෙස දක්වන පසුබිම තුල වසංගතය ජාතිවාදීකරණයට ලක්වීමේ තත්වය තුළය. එවැනි අහිතකර තොරතුරු ප්‍රචාරණයේ විපාක ඉදිරි කාලයේදී දැනගත හැකිය.

### සේවකයින් කෙසේ මෙම වසංගතයට මුහුණ දෙන්නේද?

මාධ්‍ය වාර්ථා අනුව බොහෝ ඉන්දුනිසියානු සේවකයින් ඔවුන්ගේ රැකියා හැරයාමේදී ගෙවන ලද මුදල කුඩා වෙළඳ ස්ථාන පිහිටුවීමට යොදා ඇත. හදිසි ලෙස රැකියා නොමැතිවීම නිසා සංක්‍රමණික විනිමය මගින් යැපුණ කුඩා දරුවන් හා වැඩිහිටියන් මත බලපෑම් ඇති වී ඇත. ඉන්දියාව, ඉන්දුනිසියාව ආදියේ සංක්‍රමණික ාස්වකයින් තම ගම්බිම් බලා ගමන්කරන අතර එයින් සමහරක් කෘෂිකාර්මික කාර්යන්ට යොමු වී ඇත. AFWA හි හවුල්කරුවන් ප්‍රකාශකරන පරිදි තිරුපූර්හි මෙම තත්වය නිසා ඉතා ග්‍රාමිය වැටුප් සහ කෘෂිකාර්මාන්තය ආශ්‍රිත වැටුප් වල දැඩි පාතනයක් දක්නට ලැබෙන අතර එය INR 300ක සිට INR 200ක් දක්වා පහත වැටී ඇත. මෙය සැගවුණු විරැකියාව මතුකර දක්වයි. එනම් දියුණුවන ආර්ථිකයක බහුවාර්ෂික ලක්‍ෂණයකි. මෙය තවදුරටත් වැඩිවන වෙළඳ බෝගවල මිල මත රදා පවතී. එම බෝග ග්‍රාමීය ආර්ථිකයේ වැදගත් මාධ්‍යක් වන අතර ගෝලීය ඉල්ලුම අඩුවීම නිසා මිල අවපාතනයවී ඇත. මතුවන කාරණා සම්බන්ධයෙන් වැඩි දුර අර්ථකතනය සඳහා අප දැන් සෞඛ්‍ය සේවා සහ ආහාර සුරක්‍ෂිතතාව පිලිබඳ අවධානය යොමුකරමු.

## සයවැනි කොටස

# ආහාර සුරක්ෂිතතාව

ශ්‍රමිකයින් අතර ඉතා බලවත් සංවේගය දනවන කාරණය වන්නේ ආහාර සුරක්ෂිත තාවයයි. ඇගළුම් ශ්‍රමිකයින් ඉතා අවධානම් කාණ්ඩයක ශ්‍රමිකයින් වන අතර බොහෝ අවස්ථාවල මෙම වසංගතයට පෙරද ආහාර පිලිබඳ අස්ථිරතාවයකින් පෙළුනි. ඔවුන් ඉහළ අගයකින් නීරක්තිය, මන්දපෝෂණය ආදියෙන් පෙළෙන නිසා කොවිඩ් - 19 ට භාජනය වීමේ තත්වයක් පවතී.

දශක ගණනාවක නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්ති විශ්වය මහජන බෙදීයාමේ පද්ධති (PDS) සහ කෘෂිකාර්මික පීඩනය නොනැවතී පවත්වාගෙන ඇත. එය ඉන්දියාව වැනි රටවල ආහාර සුරක්ෂිතතාවට බාධකයකි. කෘෂි ශ්‍රමය අඩුවීම, මනා සංවිධානය සහ බෙදාහැරීමේ මාධ්‍යවල ප්‍රවාහන සීමා නිසාවූ දුර්වලතා දේශීය ආහාර ආරක්ෂාවට තර්ජනයකි. ඉන්දුනීසියාවේ සහ කාම්බෝජයේ ඇතිවෙමින් තිබෙන නියඟ තත්වද මූලිකව ආහාර හිඟවීමට හේතු වී තිබේ. දහස්ගණනක් බංගලිදේශ ඇගළුම් ශ්‍රමිකයින් මහජන උත්ගෝෂණයක් කරා ගියේ කුසගින්නට වහා පිලියම් ලබා දෙන ලෙස ඉල්ලමිනි.

අවම ලෙස කාරණා දෙකක් සේවකයින් විසින් මුහුණදේ. පළමුව ආහාර සළාක සඳහා ඇතුලත් වීම සහ දෙවනුව සළාකවල අප්‍රමාණවත් භාවයයි. ඉන්දියාවේ PDS ක්‍රමවේදය බොහෝ විවේචනවලට භාජනය වී ඇත්තේ එහි ඉලක්කගත ලබාදීම්වල වැරදි නිසාය. සංක්‍රමණික සේවකයින් ඔවුන්ගේ ගම්මානවල පදිංචිභාවය

නොමැති නිසා PDS සළකා ලබාගැනීමට ඇතුල්වීම දුෂ්කර වී ඇත්තේ ඔවුන්ගේ සංචරණ ස්වාභාවය නිසාය. තිරුපූර්හි බොහෝ සේවකයින් චෝදනාකරන්නේ හැඳුනුම්පත් නොමැති නිසා ඔවුන්ට රජයේ සළාක ලබාගැනීම නොහැකි බවය. නේවාසිකාගාරවල රැඳෙන සේවකයින්ට එම සළාකය ලබාගත නොහැකි අතරම නැවත ගම්මාන කරා යන සේවකයින් අතරමැද සිරවී සිටී. ඉන්දියාවේ රටවසාදැමීමේ දුර්වල ක්‍රමවේදය නිසා 383 මරණද එසේම අවම ලෙස මරණ 58ක් කුසගින්න නිසා සහ මූල්‍යම පීඩනය නිසාද සිදුවී ඇත.

දෙවන කරුණ මතුවන්නේ සළාක ප්‍රමාණය සහ සළාකවල තත්වය මතය. වර්තමානයේදී ඉන්දියානු ශ්‍රමිකයින් හට බොහෝ විට සහල්, තිරිඟු ධාන්‍ය සහ ආහාර තෙල් ලබාදේ. ක්‍රියාකාරීන් පවසන පරිදි ආහාරවල විවිධාංගීකරණ අඩුවීම නිසා පවතින මන්දපෝෂණ තත්වය සහ දරුවන්ගේ දුර්වල තත්වය ඉන්දියාව වැනි රටවල තවදුරටත් තීව්‍ර විය හැක. දෛනික ආදායම් අහිමි දෛනික ශ්‍රමිකයින් අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට නොහැකි වී තිබේ. AFWA හවුල්පාර්ශව ඉන්දුනිසියාව සහ ශ්‍රී ලංකාවේ තත්වය පිළිබඳ පවසන්නේ ඉදිරි මාසවල ආහාර වල සුලභතාවය ප්‍රධාන ගැටළුවක් වියහැකි බවය.

## හත්වන කොටස

# සෞඛ්‍ය සේවා

"අපට බයයි අපමේ අර්බුධයෙන් බේරීමට නොහැකි වේ යැයි ; ඔවුන් වෛරසයට බෙහෙත් සොයා ගැනීමට පෙර බොහෝවිට අප මියයා හැක" - රාධා බැංගලෝර් හි ඇඟළුම් සේවකයෙක්

මෙම වසංගත ශ්‍රමිකයින් ද්විත්ව දෙගෙඩියාවක සිරකර තිබේ. එනම් වැටුප් සහිත රැකියාවල අවශ්‍යතාව සහ රැකියා ස්ථානවල ආරක්ෂාකාරී බවය. නැවත විවෘත කරන ලද කර්මාන්තශාලා ඒවායේ 30 - 70%ක් අතර ධාරිතාවයකින් පමණක් කටයුතු කරන අතර සමහර ප්‍රදේශවල ශරීර උෂ්ණත්ව මැනීම සහ විෂබීජනාශක දියර රජයේ සෞඛ්‍ය අධීක්ෂණ නිසා ලබාදී තිබේ. එසේ වුවද එක් සේවා වාරයකට දහස්ගණනක් ශ්‍රමිකයින් යොදවන ස්ථානවල ප්‍රයෝගික ගැටළු පවතී. ප්‍රවෘත්ති වාර්ථා අනුව බංගලාදේශයේ 60 - 70%ක පමණ ශ්‍රමිකයින් යොදා සමාජ දුරස්ථභාවය පිළිබඳ ත්තව නොසලකා ක්‍රියා කරමින් පවතී. බංගලාදේශයේ මැයි මස පළමු සතිය තුළදී සේවකයින් 100කට වඩා කොවිඩ් - 19 වෛරසයට ගොදුරු වූ අතර සෙසු ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය පිළිබඳවද අවධානමක් ඇතිවී ඇත. මෙය ITVC සහ ගෝලීය වෘත්තීය සමිති මගින් මෙම වසංගතය රැකියාමය රෝගයක් ලෙස හඳුනා ගන්නා ලෙස ප්‍රකාශකළ අතරතුර සිදුවිය. ලෝක කම්කරු සංවිධානය කොවිඩ් - 19 සහ පශ්චාත් කම්පන ඍතති ආබාධය (PTSD) ආදිය රැකියා ස්ථානවලදී ඇති වුව හොත් ඒවා රැකියාමය රෝගයක් ලෙස වර්ග කළ හැකි බව ප්‍රකාශ කරයි.

රැකියා ස්ථානය මත පමණක් පූර්ණ අවධානය යොමු කිරීමේ සීමා සහිත බව පැනනැගෙන්නේ ශ්‍රමිකයින්ගේ නිවාස හෝ නවාතැන් ස්ථානවල කායික දුරස්ථභාවය හෝ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව නියාමනයක් හා අධීක්ෂණයක් නොමැති බැවිනි. ඇඟළුම් ශ්‍රමිකයින් අඩු ඉඩ ප්‍රමාණයක විශාල ගණනක් එනම් 6 - 10ක ප්‍රමාණයක් ලැගුම් ගනී. සේවායෝජකයින් මෙය සඳහා වගකීම් නොගනී. එසේම මෙම නවාතැන් අඩු වැටුපක් සහිත ශ්‍රමිකයින් අවම ලෙස පහසුකම් සහිත අඩු වියදම් ස්ථාන ලබාගන්නා බැවිනි. එසේම ආරක්ෂිත ප්‍රවාහන

පහසුකම් නොමැති නිසා සංක්‍රමණික බෙංගාරුලුහි සේවකයින් නැවත විවෘත කරන ලද කර්මාන්තශාලා කරා බස් රථ, බෙදාගන්නා ලද රික්ෂෝ රථ ගමන් මගින් ශාරීරික දුරස්ථභාවය රහිතව ගමන් කරයි. මෙම මගින් ඇඟළුම් ශ්‍රමිකයින්ගේ ජීවිත රැකියා ස්ථානයෙන් පිටතදී අධි අවධානමක හෙලා ඇති බවට කනස්සලුභාවයන් නැගෙමින් පවතී.

අටවන කොටස

# සමාප්ති සටහන

මෙම වසංගතය පෙර නොවූවිරූ ආකාරයේ අර්බුධයක් ගෝලීය ඇඟළුම් සැපයුම් දාමය තුළ ඇතිකර ඇත. එසේම එය පාරාන්ධ නිෂ්පාදන පද්ධතියේ ඇති දුර්වලතා සහ එහි අවධානම් කොටස වන ශ්‍රමික ජනගහනය නිරාවරණය කර තිබේ.

මෙම නිකුතුව මතුවෙමින් පවතින ශ්‍රමිකයින්ට ආධාර සපයන ලද මාගී අවධාරණය කරන ලදි. එසේම ඔවුන්ගේ රැකියා අහිමිවීමේ රටාව, ආහාර සහ සෞඛ්‍ය පිළිබඳ තත්වයන්ද හෙළිකරන ලදි. ගෝලීය ඇඟළුම් ශ්‍රම බලකායේ අතිශයින් අවධානම් ශ්‍රමික කොටස වන්නේ දෛනික වැටුප් ලබන්නන් සහ කොන්ත්‍රාතු සේවකයින් සහ නිවාස ආශ්‍රිත සේවකයින්ය. රැකියා ඉවත් කිරීමේ රටා රැකියාවල තත්වය, අවකාශමය දුරස්ථභාවය, වයස, ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සමාජ තත්වය, වෘත්තිය සමිති සාමාජිකත්වය සහ ආගම වැනි සාධක සේවකයින්ට වෙනස්කොට සැළකීමට යොදාගෙන ඇත. වෙළඳපළ අවිනිශ්චිතභාවය සමාවක් ලෙස යොදාගෙන සේවායෝජකයින් තව දුරටත් ශ්‍රම පන්තිය කඩා දැමීමට කටයුතු කරමින් සිටී.

මෙම වසංගතය රජයන් වසංකතයට සහ එහි බලපෑම්වලට ප්‍රතිචාර දැක්වීමේ නොහැකියාවද හුවාදක්වා ඇත. සෞඛ්‍ය සේවාවලට ඇතුල්වීම, ආහාර සුරක්ෂිතතාව ඇතිකිරීම ආදී තත්ව ඇති කිරීමට නොහැකි වී තිබේ. ඉන්දුනීසියාව එහි යෝජිත කම්කරු නීති සංශෝධන කල්දමා ඇති අතර ඉන්දියාවේ බොහෝ ප්‍රන්ත සියළු කම්කරු නීති අහෝසිකර පැය 8වූ වැඩකරන දිකය පැය 12ක් දක්වා ඉහළ දමා ඇත. එය අන්තර්ජාතික සම්මුතීන්ට පටහැනි වේ. ඉන්දියානු චීන විරුද්ධවාද් මත උපයෝගී කරගනිමින් සේවා යොජකයින් විසින් වෘත්තිය සමිති ක්‍රියාකාරීත්වය අඩපණකර කර්මාන්තය ශක්තිමත් කිරීමේ වැඩපිලිවෙලකට රජය පෙළඹවීම සිදුකරමින් පවතී.

ත්‍රිපාර්ශවික ක්‍රමවේදය කම්කරු/ කර්මාන්ත ආරවුල් විසදීම සඳහා ධනවාදය යටතේ අවශ්‍ය වුවද එය ව්‍යාපාරවල කැමැත්ත ඉටු කිරීමට යොදාගෙන ඇත. මෙය කර්නාටක ප්‍රාන්තයේදී කම්කරු දෙපාර්තුමේන්තුවේ ප්‍රධාන ලේකම් වරයා එයට පත්කර ඇත. මෙය නවලිබරල් වාදී වෙනස්කම් කිරීමක් වන අතර එය වසංගතයක් වන බලපෑම් දරුණු තත්වයට පත් කිරීමට හේතු වී ඇත. එම වෙනස්කම් හා බලපෑම් වැඩකරන පන්තියේ ජනයාට විනාශකාරී මෙන්ම පවතින සමාජ විෂමතා තීව්‍රකරයි. වසංගතය නිසා වූ අස්ථිරභාවය කම්කරු නීති සහ වෘත්තිය සමිති විනාශ කිරීමට හේතුවක් ලෙස යොදානොගතයුතු අතර ඒවා ශ්‍රමය සහ ලාභාංශ අතර ඇති ව්‍යුහමය විෂමතා පාලනයට උදව් කරයි.

ගෝලීය ඇඟළුම් සැපයුම් දාමය අපාරදෘශය ආකාරයකට සංවිධානය වී ඇත්තේ සන්නාම එහි ලාභයට මිස වගවීමට එලඹී නොමැති නිසා සහ දරිද්‍රතා වැටුප් ගෙවීමට සිදුවන ආකාරයේ මිලදී ගැනීමේ පුරුදු නිසාවෙනි.

AFWA ඉල්ලා සිටිනුයේ රැකියා නැවතීම නිසාවන ආදායම් අහිමිවීම සහ වසංගතය නිසා ජීවනෝපායන්ට වූ බලපෑම් අර්ධව අඩුකර ගැනීමට එක් වරක් පමණක් වන සැපයුම්දාම සහන දායකත්වයක් (SRC) හෙවත් සන්නාම පෙර වර්ෂවල ලාභය මගින් වැඩිපුර 2% ප්‍රමාණයක් ගෙවා එය නිෂ්පාදකයා හරහා සේවකයින්ට සෘජුවම ගෙවිය යුතු බවය. මධ්‍යකාලීනව හා දිගුකාලීනව, සන්නාම පෙරට පැමිණ සාධාරණ මුදලක් හෝ ප්‍රිමියම් අගයක් මගින් ශ්‍රමිකයින්ට ජීවන වැටුපක්, සමාජ ආරක්ෂණය සහ අභිසංගමය සඳහා වූ නිදහස ආරක්ෂා කළ යුතුය.

## පිලිගැනීම

ආසියාතික බිම්වැටුප් සංධානය (AFWA) ආබිඩ් ෆිර්ඩුසායි සහ නන්දිතා වෙෙකුමාර් හට මෙම වාර්ථාව පිලියෙල කිරීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වේ. එසේම AFWA ඉතා අගනා දායකත්වයක් එක් කළ අභිරාමි සිවලොගනාදන්, රත්නා සමිනනග්, විරන්තා යුධිහා ගින්ටැංග්, අනන්යා බැටර්ජි, සික්යා සලිමාන් බැටර්ජි සහ අශිම් රොයි හට ස්තූතිය පුදකරයි. මෙම වාර්ථාව නිර්මාණය කල මහේෂ් ඩිලීප් හටද අප කෘතඥ වෙමු. AFWA අපගේ සියළු හවුල්කරුවන්ටද ඔවුන්ගේ සහයෝගයටද ස්තූතිවන්ත වේ. නිදහස හා කම්කරු ක්‍රියාකාරී සාමූහිකත්වය (FLAG) කණ්ඩායම සහ බර්ටාහි කාන්තා වෘත්තීය සමිතියටද අපගේ විශේෂ ස්තූතිය පුදකරමු.